JMC vLearning
"your virtual learning partner"

# අවදානම් කළමනාකරණ ආකෘතිමය රාමුව

## AAT අදියර III

## FCA - මූල්‍ය පාලනයන් හා විශ්ලේෂණය

ජීවන්ත පෙරේරා
B.Sc. (Accountancy) Sp., ACA, Reading for MBA (Cardiff Metropolitan-UK)

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

# ව්‍යාපාරික පරිසරය හා අවධානම

ව්‍යාපාර සංවිධාන එක් එක් නිර්ණායකයන් යටතේ වර්ගීකරණය කළ හැක.

1. අරමුණ අනුව වර්ගීකරණය
   - ලාභ පරමාර්ථ කරගත් ව්‍යාපාරයන්
   - ලාභ පරමාර්ථ කරනොගත් ව්‍යාපාරයන්

2. හිමිකාරීත්වය අනුව වර්ගීකරණය
   - පෞද්ගලික අංශයේ ව්‍යාපාර
   - රාජ්‍ය අංශයේ ව්‍යාපාර

3. මෙහෙයුම් ස්වභාවය / ස්වරූපය අනුව වර්ගීකරණය
   - නිෂ්පාදන ආයතන
   - වෙළඳ ආයතන
   - සේවා සැපයුම් ආයතන

4. නීතිමය රාමුවට අනුව වර්ගීකරණය
   - නීතිමය පුද්ගලභාවයක් ඇති ව්‍යාපාර
   - නීතිමය පුද්ගලභාවයක් නැති ව්‍යාපාර

ඉහත නිර්ණායකයන් 04ට අතිරේකව වෙනත් නිර්ණායකයන් යටතේද ව්‍යාපාර ආයතනයන් වර්ගීකරණය කළ හැක. සෑම ව්‍යාපාර ආයතනයකටම මුදුන් පමුණුවා ගැනීමට බලාපොරොත්තු වන ව්‍යාපාරික අරමුණු ගණනාවක් ඇති අතර ඉන් කීපයක් පහත දක්වේ.

උදා: * අයිතිකරුවන්ගේ ලාභ උපරිම කිරීම
* ව්‍යාපාරයේ ධනය උපරිම කිරීම
* ව්‍යාපාරික ක්ෂේත්‍රය තුළ රඳා පැවතීම (තිරසාරබාවය)
* ව්‍යාපාර කටයුතු නිසි ආකාරව පවත්වා ගැනීම
* සමාජ සුබසාධනය ලෙස දක්විය හැක.

මෙහිදී සෑම ව්‍යාපාර ආයතනයක්ම තම ව්‍යාපාර කටයුතු සිදු කිරීමේදී විවිධ වූ අවධානම් වලට මුහුණ දෙයි. සෑම ව්‍යාපාර ආයතනයක්ම ළඟාකර ගැනීමට අපේක්ෂිත යම් යම් විශේෂ අරමුණු පවතින අතර එම අරමුණු ඉටු කරගැනීමේදී අනාගතයේදී කුමක් සිදුවේද යන්න පිළිබඳව නිශ්චිතව ප්‍රකාශ කළ නොහැක.

**අවධානම යනු කුමක්ද?**

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

මේ අනුව අවධානම් ප්‍රධාන ප්‍රභේදයන් 02 ක් යටතේ වර්ගීකරණය කර දක්විය හැක.

1. අභ්‍යන්තර අවධානම්
2. බාහිර අවධානම්

## (1) අභ්‍යන්තර අවධානම්

අභ්‍යන්තර අවධානම ව්‍යාපාරය තුළින් ජනනය වේ. ආයතනය තුළ පවතින තත්ත්වයන් තුලින් ඇතිවන අවධානම් මින් අදහස් වේ. මෙම අවධානම් ප්‍රධාන ස්වරූපයන් 04 ක් යටතේ වර්ගීකරණය කළ හැක.

### (a) <u>මෙහෙයුම් අවධානම්</u>

අභ්‍යන්තර ක්‍රියාවලීන් හා මෙහෙයුම්, මෙහෙයුම් හා සම්බන්ධ පාලනයන් බිඳ වැටීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන අවධානම මින් අදහස් වේ.

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

### (b) <u>වංචා අවධානම්</u>

ව්‍යාපාරයේ අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන්ගේ වංචනික ක්‍රියාකාරකම් මගින් අලාභයන් ඇතිවීමේ අවධානම මින් අදහස් වේ.

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

### (c) <u>අනුකූලවීමේ අවධානම්</u>

සැලකිය යුතු අවධානම් හේතුවෙන් විශේෂිත රෙගුලාසි වලට යටත් වූ යම් යම් කර්මාන්තයන් පවතියි.
උදා: බැංකු කර්මාන්තය

එමනිසා එවැනි කර්මාන්තයන් තුළ ව්‍යාපාර කටයුතු කරන ව්‍යාපාර ආයතන වලට නිරන්තරයෙන්ම එම නීතිරීති හා රෙගුලාසි වලට අනුකූලවීමට සිදු වේ. එසේ නීතිරීති හා රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවධානම මින් අදහස් වේ.

### (d) <u>කීර්තිනාම අවධානම</u>

ව්‍යාපාර ආයතනයකට වෙළඳපොලේ ඇති පිළිගැනීම අහිමි වීම මත ඇතිවන බලපෑම මින් අදහස් වේ.

## (2) බාහිර අවධානම්

අභ්‍යන්තර පරිසරයෙන් ඇතිවන අවධානම් වලට අතිරේකව බාහිර පරිසරයෙන් ඇතිවන අවධානම් වලට මුහුණදීමට ව්‍යාපාරයන්ට සිදුවනු ඇත.

මෙය මූලික වශයෙන් ප්‍රධාන කොටස් 02 ක් යටතේ අධ්‍යයනය කළ හැක.

(a) සාමාන්‍ය ව්‍යාපාරික පරිසරය තුළ ඇතිවන අවධානම්

(b) කර්මාන්ත පරිසරය තුල ඇතිවන අවධානම්

JMC vLearning "your virtual learning partner"

**(a)** සාමාන්‍ය ව්‍යාපාරික පරිසරය තුල ඇතිවන අවධානම්

සාමාන්‍ය ව්‍යාපාරික පරිසරය තුල ඇතිවන අවධානම් ප්‍රධාන කොටස් 4 ක් යටතේ අධ්‍යයනය කළ හැක.

(i) **<u>දේශපාලන හා නෛතික පරිසරය</u>**

සියලුම ව්‍යාපාර ආයතනයන් කෙරෙහි රාජ්‍ය ප්‍රතිපත්තීන් සෘජුවම බලපාන අතර බොහෝ ව්‍යාපාරයන් නිසි ආකාරව පවත්වාගෙන යාමට දේශපාලන ස්ථාවර බව අත්‍යාවශ්‍ය සාධකයක් වේ. දේශපාලන අස්ථාවර බව බාහිර අවධානම් හටගන්නා එක් ප්‍රභවයකි. දේශපාලන පරිසරයට අතිරේකව නෛතික පරිසරයද ව්‍යාපාර ආයතන වලට සෘජු බලපෑමක් එල්ල කරයි.

උදා: රාජ්‍ය ප්‍රතිපත්තීන් වල සිදුවන වෙනස්කම්, රාජ්‍ය නීතිරීති හා ආර්ථික ප්‍රතිපත්තිවල වන වෙනස්කම්

(ii) **<u>ආර්ථික පරිසරය</u>**

ආර්ථික පරිසරය යනු ව්‍යාපාරය ක්‍රියාත්මක වන රටෙහි පවතින හෝ රටවල් වල පවතින ආර්ථික ප්‍රතිපත්ති හා ආර්ථික තත්ත්වයන් වේ. මෙවන් තත්ත්වයන් ද බාහිර අවධානම් ඇතිවීමට බලපායි.

උදා: පොලී අනුපාත, බදු ප්‍රතිපත්ති, උද්ධමනය, දළ දේශීය නිෂ්පාදිතය

(iii) **සමාජීය හා සංස්කෘතික පරිසරය හා තාක්ෂණික පරිසරය**

* ඉහත සඳහන් කරන ලද ප්‍රධාන කරුණු 02 ට අමතරව

1. සාමාජීය හා සංස්කෘතික පරිසරය ද, (උදා: ව්‍යාපාර ආයතනයන්ට බලපෑමක් එල්ල වන සේ සමාජ ආකල්ප වෙනස්වීම.) එනම් ආයතනය ක්‍රියාත්මක වන රටෙහි හෝ රටවල් වල පවතින සාමාජීය හා සංස්කෘතික පරිසරයන් ද.

2. තාක්ෂණික පරිසරය ද = (උදා: ව්‍යාපාරයට තරඟ කළ නොහැකි ආකාරයට, මුහුණදිය නොහැකි ආකාරයට නිෂ්පාදන තාක්ෂණයේ වෙනස්කම් සිදුවීම.)

ව්‍යාපාරයන්ට බාහිර අවධානම් ඇතිවීමට බලපෑමක් එල්ල කරන සාධකයන් වේ.

**(b)** කර්මාන්ත පරිසරය තුල ඇතිවන අවධානම්

විශේෂිත වූ කර්මාන්තයන් තුල පවතින ව්‍යාපාරයන්ට බලපානු ලබන එම ක්ෂේත්‍රයට විශේෂිත වූ අවධානම් මින් අදහස් වේ.

උදා: බැංකු කර්මාන්තය, රක්ෂණ කර්මාන්තය යනාදිය

මෙම අවධානම්, අදාල කර්මාන්තයේ ඇති සියලුම ව්‍යාපාර කෙරෙහි බලපෑමක් එල්ල කරයි.

* **<u>ඉතා වැදගත්</u>**

අභ්‍යන්තර අවධානම් ව්‍යාපාරයේ පාලනයට යටත් වන අතර, බාහිර අවධානම් ව්‍යාපාරයේ පාලනයට යටත් නොවේ.

## අවධානම් කළමනාකරණ ආකෘතික රාමුව

ඉහත අභ්‍යන්තර හා බාහිර අවධානම් සෘජුව ව්‍යාපාරයන් සඳහා බලපෑමක් එල්ල කරයි. මෙම නිසා එම අවධානම් පාලනය කිරීමට හැකි වූවත්, පාලනය කිරීමට නොහැකි වූවත් එම අවධානම් අවම කර ගැනීමට/ කළමනාකරණය කර ගැනීමට ව්‍යාපාර කටයුතු කළ යුතු වේ. ඒ අවධානම් කළමනාකරණ ආකෘතික රාමුව ක්‍රියාත්මක කළ යුතු වේ.

අවධානම් කළමනාකරණ ආකෘතික රාමුව පිළිබඳව සලකා බැලීමේදී එය ප්‍රධාන පියවරයන් 03ක් යටතේ අධ්‍යනය කළ හැක.

**1. අවධානම් තක්සේරු කිරීම**

**2. අවධානම සඳහා ප්‍රතිචාර දැක්වීම**

**3. සමීක්ෂණය හා සමාලෝචනය**

**උදාහරණ:**

JMC vLearning "your virtual learning partner"

ABC ව්‍යාපාරය ඇඟළුම් ක්ෂේත්‍රයේ නියුක්ත ව්‍යාපාරයක් වේ. එම ව්‍යාපාරයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය හා අධ්‍යක්ෂ මණ්ඩලය සහභාගී වූ රැස්වීමකදී ABC ව්‍යාපාරයේ කළමනාකරණ අධ්‍යක්ෂවරයා පහත කරුණු ඔවුන්ගේ අවධානයට යොමු කරන ලදී.

1. රජය විසින් මෑතකදී පනවා ඇති ආර්ථිකමය ප්‍රතිපත්ති හේතුවෙන් ව්‍යාපාරය යුරෝපයට අපනයනය කරන ලද ඇඟළුම්වල මිල ගණන් සීඝ්‍ර වශයෙන් ඉහළ ගොස් ඇති බවත් එය චීනය හා ඉන්දියාව වැනි තරඟකාරී රටවල් යුරෝපයට අපනයනය කරන මිල ගණන් වලට වඩා වැඩි බවත් පසුගිය කාර්තු සමග සසඳන විට අපනයනය කරන ලද ඇඟළුම් වල ප්‍රමාණය සීඝ්‍ර පහත යාමකට ලක් වී ඇති බව ප්‍රකාශ කළේය.

2. මෑතකදී ව්‍යාපාරයේ පරිගණක පද්ධතිය කිහිප වතාවක්ම ක්‍රියාවිරහිත වීම් වලට ලක් වූ බවත් එය අදාළ සැපයුම්කරුවන් සඳහා අළුත්වැඩියා කළ බවත් ඔවුන් තව වසර 02ක වගකීම් සහතිකයක් ලබාදී ඇති බව ප්‍රකාශ කළේය.

3. තම තරඟකාරී ආයතනයක් විශාල වැටුපක් ගෙවා තම ව්‍යාපාරයේ ජ්‍යෙෂ්ඨ හා එලපුරුදු සේවකයන් එම ව්‍යාපාරයට බඳවා ගැනීමේ අරමුණකින් කටයුතු කරන බවට තොරතුරු ලැබී ඇති බවත් එවැනි පුරප්පාඩුවක් ඇති වුවහොත් එවැනි සේවකයන් නැවත බඳවා ගැනීම දුෂ්කර බවත් සඳහන් කරයි.

4. ව්‍යාපාරයට සුළු වශයෙන් භාණ්ඩ සපයන සැපයුම්කරුවන් කිහිපදෙනෙකු තමාට ලබාදෙන මුදල වැඩි කරන ලෙස ඉල්ලීමක් කර ඇති බවත් එම වැඩිවීම තම ව්‍යාපාරයට ලබාදිය හැකි බවත් තවත් එවැනි සැපයුම්කරුවන් සොයාගත හැකි බවත් සඳහන් කරන ලදී.

5. ව්‍යාපාරයේ පහළ මට්ටමේ සේවකයන් කිහිපදෙනෙකු පසුගිය මාසය තුළ ව්‍යාපාරයෙන් ඉවත්ව ගිය බවත් එවැනිම තවත් සේවකයන් ව්‍යාපාරයෙන් ඉවත්ව යා හැකි බවත් ඒ සම්බන්ධයෙන් ශ්‍රමය සපයා ගැනීමේ දුෂ්කරතා ඇති නොවන බවත් පවසා සිටියි.

ඔබ ABC ව්‍යාපාරයේ මූල්‍ය කළමනාකරු බව උපකල්පනය කරන්න. ඉහත තොරතුරු පදනම් කරගෙන ව්‍යාපාරය මුහුණ දී ඇති අවධානම් පිළිබඳව තක්සේරුවක් හා ප්‍රතිචාර දැක්වීමක් සිදු කරන්න.

**අවධානම් හඳුනා ගැනීම්**

-----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

**අවධානම් විශ්ලේෂණය කිරීම්**

JMC vLearning "your virtual learning partner"

**ව්‍යාපාර ආයතනය මුහුණදෙන්නා වූ අවධානම් වලට යොදාගන්නා වූ උපායමාර්ග**

**1.** <u>අවධානම වළක්වා ගැනීම</u>

බොහෝ ව්‍යාපාර ආයතන සලකා බලනු ලබන්නේ අවධානම වළක්වා ගත හැකිද, එය වළක්වා ගැනීම අවශ්‍ය වේද යන්න පිළිබඳවයි. අවධානම වළක්වා ගැනීම මගින් ඇති විය හැකි සෘණාත්මක ප්‍රතිඵල ඉවත් කිරීමට හැකියාව ලැබේ. කෙසේ වෙතත් ප්‍රායෝගිකව අවධානම 100% වලක්වා ගැනීම කළ නොහැක.

උදා: කිසියම් ව්‍යාපාරයක පාඩු ලබන ශාඛාවන් තිබේ නම් අනාගතයේදී ලාභදායීත්වයක් කරා ගමන් නොකරන්නේ ය යන පදනම මත එය වසා දැමීමට තීරණය කිරීම.

**2.** <u>අවධානම මාරු කිරීම</u>

මෙහිදී සිදුවන්නේ එක් පාර්ශවයකට ඇති අවධානමක් කිසියම් ගෙවීමක් හෝ ප්‍රතිලාභයකට යටත්ව වෙනත් පාර්ශවයකට හුවමාරු කිරීමයි.

උදා: ස්ථාවර වත්කම් වලට අදාළ රක්ෂණයන් ලබාගැනීම

**3.** <u>අවධානම් භාර ගැනීම</u>

ප්‍රතිචාර දැක්වීමක් සිදු නොකර පවතින අවධානම භාර ගැනීම මින් අදහස් වේ. අවධානම ඇතිවීමේ හැකියාව අඩු අවස්ථාවකදී හා එයින් ඇති විය හැකි බලපෑම අඩු අවස්ථාවකදී හා එම අවධානම ව්‍යාපාරය පිළිගැනීමට කැමති අවස්ථාවකදී මෙය භාවිතා කළ හැක.

## 4. අවධානම අවම කිරීම

ප්‍රායෝගිකව බොහෝ ව්‍යාපාරයන් සිදු කරනු ලබන්නේ තමා මුහුණ දෙන අවධානම අවම කර ගැනීමට උත්සාහ කිරීමයි. සඵලදායී ගි/හා/අ/පා/ප ව්‍යාපාරය තුළ ස්ථාපිත කිරීම මගින් අවධානම 100% වළක්වා ගැනීමට නොහැකි වුවද එය සැලකිය යුතු මට්ටමකට අඩුකර ගැනීම සිදු කළ හැක. මීට අමතරව පහත පියවරයන් අවධානම අවම කිරීමට ව්‍යාපාරයන් භාවිතා කරයි.

i. මෙහෙයුම් විවිධාංගීකරණය - Operational Diversification

----------------------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------

ii. ව්‍යාපාර ආපතික සැලසුම්කරණය - Business Contingency Plan

----------------------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------

iii. අවධානම බෙදාහැරීම - Risk Sharing

----------------------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------

JMC vLearning "your virtual learning partner"